රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Services, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකථන / தொலைபேசி / Telephone: **(94) 011- 2694560**
ෆැක්ස් / தொலைநகல் / Fax: **(94) 011- 2692254**
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: **dgcs@pubad.gov.lk**
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: **www.pubad.gov.lk**


මගේ අංකය / எனது இல / My No: CS/ICTS/01/නව බඳවා ගැනීම
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.10.13

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණිය සහ 2 පන්තියේ II ශ්‍රේණිය සඳහා 2020.03.16 දින සිට පත් කර ඇති නිලධාරීන්ගේ වැඩ භාරගත් දිනය**

උක්ත කරුණ සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කළ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක R/DO/PER.APP/2020 හා 2020.05.04 දිනැති ලිපිය හා බැදේ.

02. එම ලිපියේ 03(b) වගන්තියේ දක්වා ඇති ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණිය සහ 2 පන්තියේ II ශ්‍රේණිය සඳහා පත් වූ නිලධාරීන්ගේ පත්වීම ක්‍රියාත්මක වන දිනය පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සඳහන් එම කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/05-05/05/2018 හා 2020.09.17 දිනැති ලිපියේ විධිවිධාන පහත පරිදි කාරුණිකව දන්වමි.

I. මගේ 2020.02.24 දිනැති පත්වීම් ලිපිය මගින් 2020.03.16 දිනැතිව ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණිය සහ 2 පන්තියේ II ශ්‍රේණියේ තනතුරකට පත් කරන ලදුව 2020.06.17 දින හෝ ඊට පෙර විවිධ දිනවල රාජකාරි භාරගත් සියලුම නිලධාරීන්ගේ පත්වීම් ක්‍රියාත්මක වන දිනය **2020.03.16** දින ලෙස සලකා කටයුතු කිරීම.

II. එම නිලධාරීන්ගේ උසස්වීම් හා ජ්‍යෙෂ්ඨත්වය සළකා බැලීම සඳහා පමණක් 2020.03.16 සිට 2020.06.17 දින දක්වා වූ කාල සීමාව සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් ලෙස සැළකීම

III. ඉහත සඳහන් කාල පරිච්ඡේදය (රාජකාරි භාරගැනීම සඳහා වාර්තා නොකරන ලද) වෙනුවෙන් හිඟ වැටුප් ලබා ගැනීම සඳහා අයිතිවාසිකමක් නොමැති බව

03. මේ පිළිබඳ අදාළ නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි.

**එස්. ආලෝකබණ්ඩාර**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්